
ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම පොළ ඉදිකිරීම සඳහා ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙතින් ප්‍රතිපාදන ඉල්ලා යැවිය යුතු බවත්, කලේගාන පොළ භූමියෙන් ඉවත් කරන ලද තහඩු හා යකඩ බට මේ සඳහා යොදාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කපුහෙම්පල, කැරූන්විල ප්‍රදේශයේ සභාව සතු ඉඩමේ පොළක් ඉදිකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**46.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින හපුගල මංසන්ධිය හා ඒ අවට අනවසරයෙන් කරනු ලබන පහත සඳහන් ඉදිකිරීම් සම්බන්ධව පරීක්ෂාකර බලා නඩු පැවරීමට යෝජනා කරමි.

I. පරිසර හානියට පත්කරමින් අපේ ගම හන්දියට නුදුරින් කුඹුරු ඉඩම අනවසරයෙන් ගොඩකර අනවසරයෙන් ඉදිකර ඇති හාඩ්වෙයාර් ගොඩනැගිල්ල.
II. හපුගල මංසන්ධිය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති බටුවන්තුඩාව මාර්ගයට හැරෙන ස්ථානයේ ඉදිකරමින් පවතින දෙමහල් ගොඩනැගිල්ල.
III. බටුවන්තුඩාව පීල්ල ආසන්නයේ ගරූන්ඩ් පැනරෝමා වෙන්දේසි ඉඩමේ මාර්ගයට අවහිර වන ලෙස ඉදිකර ඇති තුන්මහල් ගොඩනැගිල්ල.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.ජී යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර විසින් අදහස් දක්වමින් මෙම ගොඩනැගිලි මේ වන විට ඉදිකර ඇති බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් අනවසරයෙන් කුඹුරු ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව පවරනු ලබන නඩු පරාජය වන බවත්, හපුගල දහනායක හාඩ්වෙයාර් ආයතනය ඉදිකර ඇති ඉඩම ඒ ශ්‍රේණියේ කුඹුරක් බවත්, එම කුඹුරෙන් පර්චස් දහයක බිම් කොටසක් පමණක් කමතක් ඉදිකර ගැනීමට අවසර ලබාදී ඇති බවත්, තමාගේ යෝජනාවට අදාළ අනවසර ඉදිකිරීම් සඳහා නඩු පැවරීමේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් දහනායක හාඩ්වෙයාර් ආයතනය අනවසරයෙන් ඉදිකිරීම පිලිබඳව සභාව විසින් නඩු පවරා ඇති බවත් එම ඉඩම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පැවරූ නඩුව නිෂ්ප්‍රභා කර ඇති බවත්, අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේ නම් මේ වන විට සිදුකර ඇති ඉදිකිරීම් කටයුතු සඳහා දඩ අයකර එම ගොඩනැගිල්ල අනුමත කළ හැකි බවත්, ඒ සඳහා සැලසුම් කමිටුව හරහා තීන්දුව ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය :-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින හපුගල මංසන්ධිය හා ඒ අවට අනවසරයෙන් කරනු ලබන පහත සඳහන් ඉදිකිරීම් සම්බන්ධව පරීක්ෂාකර බලා නඩු පැවරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

I. පරිසර හානියට පත්කරමින් අපේ ගම හන්දියට නුදුරින් කුඹුරු ඉඩම අනවසරයෙන් ගොඩකර අනවසරයෙන් ඉදිකර ඇති හාඩ්වෙයාර් ගොඩනැගිල්ල.
II. හපුගල මංසන්ධිය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති බටුවන්තුඩාව මාර්ගයට හැරෙන ස්ථානයේ ඉදිකරමින් පවතින දෙමහල් ගොඩනැගිල්ල.
III. බටුවන්තුඩාව පීල්ල ආසන්නයේ ගරැන්ඩ් පැනරෝමා වෙන්දේසි ඉඩමේ මාර්ගයට අවහිර වන ලෙස ඉදිකර ඇති තුන්මහල් ගොඩනැගිල්ල.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**47.** හෝළුවාගොඩ - කරාපිටිය මාර්ගය සහ රිච්ඩ් පතිරණ විද්‍යාලය අසළ සිට ගොඩකන්ද දක්වා ඇති මාර්ගය වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට පුළුල් කර සංවර්ධනය කරන ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් තමා විසින් ඉල්ලන ලද බොහෝමයක් ව්‍යාපෘති ඉටුකර ඇති බැවින් ඒ සඳහා ස්තුතිය පළකිරීමක්ද අන්තර්ගත කොට මෙම ලිපිය යොමුකළ යුතු බවත්, පසුගිය දිනවලදී මාකන්වත්ත මාර්ගය සහ ලබුදූව මාර්ගය යන මාර්ගයන් දෙක තමාගේ ඉල්ලීම අනුව ප්‍රීමික්ස් යොදා සංවර්ධනය කළ බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය :-** හෝළුවාගොඩ-කරාපිටිය මාර්ගය සහ රිච්ඩ් පතිරණ විද්‍යාලය අසළ සිට ගොඩකන්ද දක්වා ඇති මාර්ගය වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට පුළුල් කර සංවර්ධනය කරන ලෙස දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

අංක 48 දරණ යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.

**49.** බෝගහවේල්ල මාර්ගයේ බෝධිය අසළ මාර්ග කොටස පුළුල් කොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම මාර්ගය වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට පුළුල්කොට සංවර්ධනය කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය :-** බෝගහවේල්ල මාර්ගයේ බෝධිය අසළ මාර්ග කොටස පුළුල් කොට සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>**

**50.** හපුගල ඉංජිනේරු පීඨයට පවරාගත් සභාව සතු මාර්ගය වෙනුවට ලබාදී ඇති ඉඩම යම් සංවර්ධන කටයුත්තක් සඳහා යොදා ගැනීම සුදුසු බවත්, එහි ආරක්ෂිත වැට කඩා දමා ඇති තැන් නැවත සකස්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** හපුගල ඉංජිනේරු පීඨයට පවරාගත් සභාව සතු මාර්ගය වෙනුවට ලබාදී ඇති ඉඩම යම් සංවර්ධන කටයුත්තක් සඳහා යොදා ගැනීම සුදුසු බවත්, එහි ආරක්ෂිත වැට කඩා දමා ඇති තැන් නැවත සකස්කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**51.** මොල්ලිගොඩවත්ත, ප්‍රධාන මාර්ග දෙකේ මාර්ගවලට අයත් සීමා මැන ලකුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් අදහස් දක්වමින් ඉදිකිරීම් කටයුතු සිදුකිරීම, වැටවල් ගැසීම සහ වගා කටයුතු සිදුකිරීම නිසා මෙම මාර්ගය පටුවී ඇති බැවින් මෙම මාර්ගයන් දෙක මැන මායිම් සලකුණු කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මොල්ලිගොඩ වත්ත ප්‍රදේශයේ මාර්ගයන්හි සහ ඉඩම්වල මායිම් වෙනස් වී ඇති බැවින් එම මායිම් නැවත ලකුණු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කළ යුතු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** මොල්ලිගොඩවත්ත, ප්‍රධාන මාර්ග දෙකේ මාර්ගවලට අයත් සීමා මැන ලකුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් අදහස් දක්වමින් සිට්ට්‍රස් වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකරන ස්ථානය තමා ඇතුළු මන්ත්‍රීවරු කිහිපදෙනෙකු පරීක්ෂා කළ බවත්, එම නිසා තමා විසින් මෙම මහා සභා රැස්වීමට යෝජනාවක් ඉදිරිපත් කළ නමුත් ගරු සභාපතිතුමා විසින් එම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් නොකළ බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව ගැටළු පවතී නම් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඕනෑම ගරු සභිකවරයෙකුටම ගත හැකි බවත්, කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවන ලද මුදලට සිදුකරන ලද කාර්යයන් පිළිබඳව තමා විසින් සභාව දැනුවත් කරන ලද බවත් ප්‍රකාශ කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**52.** කළුවර ලී වල මිල අධිකවීම නිසා කැටයම් ශිල්පීන්ට කරුවල ලී ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති බැවින් ජාතික ශිල්ප සභාවේ ලී ලබාගැනීමේ ලියාපදිංචි නාම ලේඛනය අනුව සහනදායී මිලකට කැටයම් ශිල්පීන්ට කරුවල ලී ලබා ගැනීම සඳහා අදාළ ආයතන දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කළුවර ලී වල මිල අධිකවීම නිසා කැටයම් ශිල්පීන්ට කරුවල ලී ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති බැවින් ජාතික ශිල්ප සභාවේ ලී ලබාගැනීමේ ලියාපදිංචි නාම ලේඛනය අනුව සහනදායී මිලකට කැටයම් ශිල්පීන්ට කරුවල ලී ලබා ගැනීම සඳහා අදාළ ආයතන දැනුවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**53.** මාම්පිටිය, මිහිඳු මාවත සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** මාම්පිටිය, මිහිඳු මාවත සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**54**. වටරැක - නැගෙනහිර, හානගල වත්ත පාර, සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** වටරැක - නැගෙනහිර, හානගල වත්ත පාර, සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**55**. මාම්පිටිය, අඹගහවත්ත මාර්ගයේ ඉතිරිකොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** මාම්පිටිය, අඹගහවත්ත මාර්ගයේ ඉතිරිකොටස සංවර්ධනය කිරීමට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**56**. වටරැක - නැගෙනහිර, චන්ද්‍රරේ බේකරිය අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** වටරැක - නැගෙනහිර, චන්ද්‍රරේ බේකරිය අසළ මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**57**. කලේගාන, අමයුරු බේකරිය අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කලේගාන, අමයුරු බේකරිය අසළ මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**58**. කලේගාන, වී.සී පාරේ, රත්නසිරි මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කලේගාන, වී.සී පාරේ, රත්නසිරි මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**59**. කලේගාන, වී.සී පාරේ, විමලරත්න මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කලේගාන, වී.සී පාරේ, විමලරත්න මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා**

**60.** පලාගලකන්ද, දෙවන පටුමග මාර්ගයේ අවසාන කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** පලාගලකන්ද, දෙවන පටුමග මාර්ගයේ අවසාන කොටස සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**61**. කිතුලම්පිටිය, අලුත්ගෙදර වත්ත, මාර්ගය සහ පැති බැම්ම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කිතුලම්පිටිය, අලුත්ගෙදර වත්ත, මාර්ගය සහ පැති බැම්ම සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**62**. අප ප්‍රාදේශීය සභාවට සම්බන්ධ කාර්යාල කටයුතු ගාලු නගරයේ පිහිටා ඇති කාර්යාල හා සම්බන්ධ බැවින් එම කටයුතු කඩිනමින් සහ අඩු වියදමින් ඉටුකර ගැනීමට අප ප්‍රාදේශීය සභාවේ සේවක මහතෙකු පණිවුඩකරුවෙකු වශයෙන් පත්කිරීමටත්, ඔහුට සභාව මගින් ඉන්ධන දීමනාවක් ගෙවීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් අදහස් දක්වමින් හිටපු ලේකම්තුමා විශ්‍රාම යාමෙන් පසු නව ලේකම්තුමා හට රාජකාරි ආවරණය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ ලිපිය රැගෙන ඒමට කෘෂ කැබ් රථය කිහිප වතාවක්ම යැවීමට සිදුවූයේ අඩුපාඩු සහිතව එම ලිපිය සභාවට රැගෙන ඒම නිසා බවත්, එම ප්‍රමාදය නිසා බදාදා දින දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පැවති කමිටුව වෙත අදාළ ලිපිය යොමුකර ගැනීමට නොහැකි වූ බවත්, එම නිසා සභාවේ සේවකයෙකු බයිසිකල් පණිවුඩකරුවෙකු ලෙස පුහුණුකර අමතර දීමනාවක් ඒ සඳහා ලබාදීමෙන් මෙම කාර්යය නිවැරදිව සිදුකර ගත හැකි බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** අප ප්‍රාදේශීය සභාවට සම්බන්ධ කාර්යාල කටයුතු ගාලු නගරයේ පිහිටා ඇති කාර්යාල හා සම්බන්ධ බැවින් එම කටයුතු කඩිනමින් සහ අඩු වියදමින් ඉටුකර ගැනීමට අප ප්‍රාදේශීය සභාවේ සේවක මහතෙකු පණිවුඩකරුවෙකු වශයෙන් පත්කිරීමටත්, ඔහුට සභාව මගින් ඉන්ධන දීමනාවක් ගෙවීමටත් මහා සභාව විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**63**. කිතුලම්පිටිය, ධම්මරතන මාවතේ, සුනිල් පියතිලක මහතාගේ නිවස අසළ කාණුව අවශ්‍ය පරිදි සිලින්ඩර් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කිතුලම්පිටිය, ධම්මරතන මාවතේ, සුනිල් පියතිලක මහතාගේ නිවස අසළ කාණුව අවශ්‍ය පරිදි සිලින්ඩර් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**64**. කිතුලම්පිටිය, සුප්‍රීම් සිටි මාර්ගයේ කාණුවට සිලින්ඩරයක් යොදා සංවර්ධනය කිරීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කිතුලම්පිටිය, සුප්‍රීම් සිටි මාර්ගයේ කාණුවට සිලින්ඩරයක් යොදා සංවර්ධනය කිරීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**65**. තුංහිරිපාන, හොරගස්කැලය මාර්ගය දෙපස සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** තුංහිරිපාන, හොරගස්කැලය මාර්ගය දෙපස සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන පුළුල් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**66**. රත්නගිරිවත්ත, පැලවත්ත අතුරු මාර්ගය දෙපස පස් ඉවත් කර පුළුල් කිරීම සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** රත්නගිරිවත්ත, පැලවත්ත අතුරු මාර්ගය දෙපස පස් ඉවත් කර පුළුල් කිරීම සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා**

**67.** මහවත්ත මාර්ගයේ බුද්ධසිරි මහතාගේ නිවස ඉදිරිපිට පවතින බෝක්කුව වෙත ජලය ගලා බැසීම සඳහා කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ස්ථානයේ කාණුව ඇහිරීම නිසා පසුගිය කාලයේ පැවති වර්ෂාව හේතුවෙන් මෙම මාර්ගයේ ගමනාගමන කටයුතු වලට බාධා මතුවූ බවත්, මෙම මාර්ගය සංවර්ධනය කරන තෙක් ජේ.සී.බී යන්ත්‍රය යොදවා කාණුව කැපීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** මහවත්ත මාර්ගයේ බුද්ධසිරි මහතාගේ නිවස ඉදිරිපිට පවතින බෝක්කුව වෙත ජලය ගලා බැසීම සඳහා කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**68**. මහවත්ත, ඉසුරු පෙදෙස ප්‍රධාන මාර්ගයේ පවතින කඩතොළු වූ ස්ථාන පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් අදහස් දක්වමින් ඉසුරු මාවතේ ඉහළ කොටසේ මාර්ගය තැනින් තැන කැඩී ඇති බැවින් ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ආරම්භ කළ පසු මෙම යෝජනාව ක්‍රියාත්මක කළ හැකි බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** මහවත්ත, ඉසුරු පෙදෙස ප්‍රධාන මාර්ගයේ පවතින කඩතොළු වූ ස්ථාන පිළිසකර කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 01.30ට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>**

**69.** උළුවිටිකේ, ප්‍රයිම් ගාර්ඩන් මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** උළුවිටිකේ, ප්‍රයිම් ගාර්ඩන් මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**70.** නාවින්න, මුස්ලිම් පල්ලිය මාර්ගයේ, අස්වර් මහතාගේ නිවස ඉදිරියෙන් ඇති කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** නාවින්න, මුස්ලිම් පල්ලිය මාර්ගයේ, අස්වර් මහතාගේ නිවස ඉදිරියෙන් ඇති කාණුව සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**71.** ටිකිරුජ්ජදූව වත්ත, ශ්‍යාමලී මහත්මියගේ නිවසට යන අතුරු මාර්ගයේ පැති බැම්මක් යොදා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ටිකිරුජ්ජදූව වත්ත, ශ්‍යාමලී මහත්මියගේ නිවසට යන අතුරු මාර්ගයේ පැති බැම්මක් යොදා මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**72.** නාවින්න, සඟබෝවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** නාවින්න, සඟබෝවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**73.** උළුවිටිකේ, සන්සයිඩ් ගාර්ඩන්හි, ධනපාල මහතාගේ නිවසට යන මාර්ගය කුඩා වර්ෂාවකදී පවා විශාල ජල ප්‍රමාණයක් ප්‍රධාන මාර්ගයට ගලා ඒම නිසා පහළ ප්‍රදේශයේ නිවාස කිහිපයක් ජලයෙන් යටවීම සිදුවන බැවින් එම මාර්ගය හරහා කොන්ක්‍රීට් කාණුවක් යොදා දැල් ආවරණයක් සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** උළුවිටිකේ, සන්සයිඩ් ගාර්ඩන්හි, ධනපාල මහතාගේ නිවසට යන මාර්ගය කුඩා වර්ෂාවකදී පවා විශාල ජල ප්‍රමාණයක් ප්‍රධාන මාර්ගයට ගලා ඒම නිසා පහළ ප්‍රදේශයේ නිවාස කිහිපයක් ජලයෙන් යටවීම සිදුවන බැවින් එම මාර්ගය හරහා කොන්ක්‍රීට් කාණුවක් යොදා දැල් ආවරණයක් සහිතව සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 01.35 ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමාගේ යෝජනා</u>**

**74.** වැලිකැටියවත්ත මාර්ගයේ සභාවෙන් අනුමත වී ඇති පැති බැම්ම කඩිනමින් සකස්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම යෝජනාව තමා විසින් මීට අවුරුද්දකට පමණ පෙර ඉදිරිපත් කළ බවත්, මෙම ස්ථානය පස් කණ්ඩිය ගිලා බැස ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** වැලිකැටියවත්ත මාර්ගයේ සභාවෙන් අනුමත වී ඇති පැති බැම්ම කඩිනමින් සකස්කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**75.** වැලිකැටියවත්ත මාර්ගය දිගේ බෝගහවෙල්ල දක්වා ඇති කාණු පද්ධතිය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් කුඹුර පැත්තේ සිට අඩි පහක ප්‍රමාණයක් රක්ෂිත කොටස ලෙස වෙන්කර ඇති බවට දන්වා ඇති බැවින් එම කාණු පද්ධතිය පුළුල් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම ස්ථානයේ කාණු පද්ධතිය පුළුල් කොට සංවර්ධනය කිරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කොට ඇති බවත්, කාණුවේ අනෙක් පස අඩි පහක පමණ ප්‍රමාණයක් රක්ෂිතය ලෙස තබා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** වැලිකැටියවත්ත මාර්ගය දිගේ බෝගහවෙල්ල දක්වා ඇති කාණු පද්ධතිය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් කුඹුර පැත්තේ සිට අඩි පහක ප්‍රමාණයක් රක්ෂිත කොටස ලෙස වෙන්කර ඇති බවට දන්වා ඇති බැවින් එම කාණු පද්ධතිය පුළුල් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**76.** ජස්ටින් කන්දේ සිට ගලා බසින ජල මාර්ගයේ රණසිංහ කඩය සහ රාමනායක කඩය අසළ ඇති බෝක්කු පසුගිය කාලවකවානුවේදී පුළුල්කොට සංවර්ධනය කර ඇති නමුත් වැලිකැටියවත්ත මාර්ගයේ කාණු පද්ධතිය කුඩා බැවින් එම කාණු පද්ධතිය පුළුල්කොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් ජස්ටින් කන්දේ සිට ගලා එන මෙම ජල මාර්ගයේ බෝක්කු පුළුල් කොට ඇති නිසා ජලය ගලා බැසීම ක්‍රමවත්ව සිදුවන නමුත්, වැලිකැටිය ප්‍රදේශයේ ජල මාර්ගය පටුවී ඇති බැවින් එම නිසා මෙම කාණු පද්ධතිය පුළුල් කොට සංවර්ධනය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ජස්ටින් කන්දේ සිට ගලා බසින ජල මාර්ගයේ රණසිංහ කඩය සහ රාමනායක කඩය අසළ ඇති බෝක්කු පසුගිය කාලවකවානුවේදී පුළුල්කොට සංවර්ධනය කර ඇති නමුත් වැලිකැටියවත්ත මාර්ගයේ කාණු පද්ධතිය කුඩා බැවින් එම කාණු පද්ධතිය පුළුල්කොට සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**77.** ගොඩකන්ද, වැරැල්ලාන වත්තේ, ග්‍රාම නිලධාරි කාර්යාලයට යාබද ඉඩමේ හෙන්රි අබේවර්ධන මයාට අයත් පොල් ගසක් ප්‍රධාන මාර්ගයට නැමී ඇති නිසා පොල් ගෙඩි සහ පොල් අතු පාරට ඇදවැටීම හේතුවෙන් මාර්ගයේ ගමනාගමන කටයුතු වලට බාධා ඇති බැවින් එම පොල් ගස සභා අරමුදලින් කපා වැයවූ මුදල පොල් ගස හිමිකරුගෙන් අයකර ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු කිසිදු ගරු සභිකවරයෙකු මෙම යෝජනාව ස්ථිර නොකරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් අදහස් දක්වමින් කරාපිටිය වැලිගම වෛරස් රෝගය වැළඳීම නිසා පොල් ගස් 280කට ආසන්න ප්‍රමාණයක් කපා ඉවත් කළ බවත්, මීට අමතරව සුදු මැස්සා රෝගය වැළඳීම නිසාද පොල් ගස් විශාල ප්‍රමාණයක් රෝගී වී ඇති බවත්, එම නිසා මෙම අනතුරුදායක පොල් ගසේ අතු කපා සුද්ධ කිරීම මගින් අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම සුදුසු බවත්, මෙම පොල් ගසෙන් මාර්ගයට ඇති අනතුරුදායක තත්ත්වය මග හරවාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම පොල් ගසෙන් අවදානම් තත්ත්වයක් පවතින බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි සහ ප්‍රදේශවාසීන් විසින් දැනුවත් කිරීම නිසා තමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම පොල් ගස ඇද බැඳීම මගින් පාරට ඇති අනතුරුදායක තත්ත්වය ඉවත් කළ හැකි බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා මැදිහත් වී මෙම ගැටළුව විසඳීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ඉහත යෝජනාව ස්ථිර නොකළ බැවින් සභා සම්මත නොවීය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>**

**78.** ඕපාත, ගොඩදූව වත්ත, මාර්ගයේ ජලයෙන් යටවන කොටස සහ එම මාර්ගයේ අවසන් කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ඕපාත, ගොඩදූව වත්ත, මාර්ගයේ ජලයෙන් යටවන කොටස සහ එම මාර්ගයේ අවසන් කොටස සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**79.** මීපාවල, ගමගේවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පන්නමග, ගමගේවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි ලෙස ඉහත යෝජනාව සඳහා සංශෝධනයක් ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අතර එම සංශෝධනය ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** ඕපාත, ගොඩදූව වත්ත, මාර්ගයේ ජලයෙන් යටවන කොටස සහ එම මාර්ගයේ අවසන් කොටස සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**80.** අප ප්‍රාදේශීය සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන්ගේ සේවය ස්ථිර කර ගැනීම සඳහා මැදිහත්වීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් අදහස් දක්වමින් දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන්ගෙන් වැඩි දෙනෙක් මෙම සභා වාරයේදී බඳවාගනු ලැබූ සේවකයන් බැවින් එම සේවකයන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා මැදිහත්විය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් නව ස්ථිර බඳවාගැනීම් මේ වන විට නතර කර ඇති බවත්, මීට පෙර සභා වාරයේද බඳවාගත් සේවකයන් කිහිප දෙනෙකුගේද සේවය ස්ථිර කර ගැනීමට නොහැකිව සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** අප ප්‍රාදේශීය සභාවේ දැනට කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන්ගේ සේවය ස්ථිර කර ගැනීම සඳහා මැදිහත්වීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**81.** අප ප්‍රාදේශීය සභාවේ සේවය කොට විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප ලබා ගැනීමට නොහැකි වූ සේවකයන් හට විශ්‍රාම වැටුප ලබා ගැනීමට මැදිහත්වීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම කාර්යය මන්ත්‍රී මණ්ඩලය එකතු වී සිදුකළ යුතු බවත්, මෙම සභාවාරය විසිරුවා හැරිය පසු මේ සඳහා මැදිහත් විය නොහැකි බැවින් මේ සඳහා මැදිහත්විය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** අප ප්‍රාදේශීය සභාවේ සේවය කොට විශ්‍රාම ගොස් විශ්‍රාම වැටුප ලබා ගැනීමට නොහැකි වූ සේවකයන් හට විශ්‍රාම වැටුප ලබා ගැනීමට මැදිහත්වීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**82.** බෝපෙ, වටරැක පාරේ වසන්ත මහතාගේ නිවස අසළ කොන්ක්‍රීට් කාණුවක් යොදා දැල් ආවරණයක් සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් අදහස් දක්වමින් සිලින්ඩර් යොදා මෙම ගැටළුව විසඳිය නොහැකි බැවින් කම්බි දැලක් යොදා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජනා කළ බවට ප්‍රකාශ කරන ලදී

**සභා සම්මුතිය ඃ-** බෝපෙ, වටරැක පාරේ වසන්ත මහතාගේ නිවස අසළ කොන්ක්‍රීට් කාණුවක් යොදා දැල් ආවරණයක් සහිතව සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා**

83. වැවේවත්ත, ඇඹිලිකැටිය වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රි කාංචනා මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** වැවේවත්ත, ඇඹිලිකැටිය වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**84.** කුරුන්ද කන්ද, සණස බැංකුව අසළ පිවිසුමේ අසලින් ඇති මාර්ගයේ ධනපාල මහතාගේ නිවස අසළ අඩි පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රි කාංචනා මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කුරුන්ද කන්ද, සණස බැංකුව අසළ පිවිසුමේ අසලින් ඇති මාර්ගයේ ධනපාල මහතාගේ නිවස අසළ අඩි පාර සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**85.** කුරුන්ද කන්ද පහල මාර්ගයේ, සංවර්ධනය නොවූ මාර්ග කොටස් දෙක සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රි කාංචනා මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කුරුන්ද කන්ද පහල මාර්ගයේ, සංවර්ධනය නොවූ මාර්ග කොටස් දෙක සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**86.** කුරුන්ද කන්ද, සණස බැංකුව අසළ පිවිසුමේ අසලින් ඇති මාර්ගයේ ඉරුෂ මහතාගේ නිවස අසළ තුංමන්හන්දිය පුළුල්කොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රීනි එම්.ගයාත්‍රි කාංචනා මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** කුරුන්ද කන්ද, සණස බැංකුව අසළ පිවිසුමේ අසලින් ඇති මාර්ගයේ ඉරුෂ මහතාගේ නිවස අසළ තුංමන්හන්දිය පුළුල්කොට සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 01.40ට ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-11-29 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව බහුතරයෙන් සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2022-11-29 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව බහුතරයෙන් සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2022 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2022 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>**

2022 වර්ෂයේ නොවැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>04. වෙනත් ලේඛන</u> ඃ-**

**01.** 2023 වර්ෂයේ සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉහත ලේඛනය සභාගත කරන ලදී.

(ප.ව 01.45ට ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සහ ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>(උආ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u>**

**<u>පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය</u>**

**<u>2022 වර්ෂයේ දෙසැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් ගරු සභිකවරුන් කිහිපදෙනෙකු විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන ලෙස ඉල්ලීමක් ඉදිරිපත්කොට ඇති නමුත්, එම ඉල්ලීම් ලිපියේ සඳහන් කරුණු ගැන අද දින මහා සභා රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ බැවින් නැවත විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට අවශ්‍ය නොවන බවත්, මීළඟ මහා සභා රැස්වීමේදී එම කරුණු ගැන අවශ්‍ය නම් නැවත සාකච්ඡා කළ හැකි බවත්, නැතිනම් ප්‍රගතිය සමාලෝචනය කිරීමට වෙන් කර ඇති මෙම අවස්ථාවේදී එම කරුණු ගැන සාකච්ඡා කිරීමට නැවත අවස්ථාව ලබා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් සිට්ට්‍රස්වත්තේ ආදාහනාගාරය ඉදිකරනු ලබන භූමිය තමා විසින් නිරීක්ෂණය කළ බවත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ආදාහනාගාරයක් අවශ්‍යතාවය තිබෙන බවත්, මෙම ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව තමා විසින් වාර්තාවක් සකස්කළ බවත්, දැනට සිදුකර ඇති ඉදිකිරීම් කටයුතු වල කොන්ක්‍රීට් කණු එකිනෙකට සමාන්තරව පිහිටා නැති බවක් සහ ඇතැම් කොන්ක්‍රීට් කණුවල අත්තිවාරම පස් දමා පුරවා තිබුණේ නැති බවක් තමා විසින් නිරීක්ෂණය කළ බවත්, මෙම ආදාහනාගාරය ප්‍රාදේශීය සභාවේ මුදල් වලින් සිදුකරනු ලබන බවත්, වසරක පමණ කාලයක් මෙම ඉදිකිරීම් කටයුතු සඳහා ගත වූ නමුත් සිදුකර ඇති සංවර්ධන කටයුතු ප්‍රමාණවත් නොවන බවත්, මෙම ඉදිකිරීමේ කටයුතු අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් විසින් ද නිරීක්ෂණය කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අදහස් දක්වමින් පසුගිය කාලයේ පැවති ඉන්ධන සපයා ගැනීමේ අපහසුතාවයන් නිසා සහ ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ඉහළ යාම නිසා සංවර්ධන කටයුතු අඩාළ වූ බවත්, සිට්ට්‍රස්වත්තේ ආදාහනාගාරය ඉදිකරනු ලබන භූමිය තාක්ෂණ නිලධාරිතුමා සමග ගොස් නිරීක්ෂණ කර ගරු සභිකවරුන් හට ඇති ගැටළු සාකච්ඡා කොට විසඳාගත හැකි බවත්, ඒ සඳහා දිනයක් තමා විසින් ඉදිරියේදී ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් අදහස් දක්වමින් ප්‍රගතිය ගැන සාකච්ඡා කිරීම මහා සභා රැස්වීමේ අවසානයේ යොදාගෙන තිබීම හේතුවෙන් ගරු සභිකවරු මහා සභා රැස්වීමෙන් පිටව යාම නිසා සන පූර්ණය නොමැතිවීමෙන් ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීමට බාධා මතුවන බවත් ප්‍රකාශ කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u> :- නැත (සියළුම ගරු සභිකවරු මහා සභා රැස්වීමට සහභාගි විය)**

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2023-01-18 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 02.10 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.